# "Economic Insights Challenge" රචනා තරගය - 2023

**ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**තේමාව: "පුනරුදය කරා: ශ්‍රී ලංකාවේ අතිදුෂ්කර චාරිකාව"**

**විද්‍යෝදය ආර්ථිකවිද්‍යා දිනය-2023ට සමගාමීව ආර්ථික විද්‍යාර්ථීන් සඳහා සංවිධානය කරනු ලබන රචනා තරගය**

ශ්‍රී ලංකාව දීර්ඝ ඉතිහාසයක් සහ සුවිශේෂ සංස්කෘතියක් ඇති රටක් වන නමුත් වර්තමානයේ දී දැඩි අභියෝගවලට මුහුණ දී ඇත. මෙම අභියෝගාත්මක කාලයෙන් සාමාන්‍ය ආර්ථික පසුබිම කරා ගමන් කිරීමට ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසංස්කරණ පිළිබඳව ඉහත තේමාවට අනුව සුදුසු මාතෘකාවක් යටතේ රචනාවක් ලිවීමට ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශය ඔබට ආරාධනා කරයි.

ඔබගේ රචනා තුළින්, ශ්‍රී ලංකාව දුෂ්කරතාවන්ට මුහුණ දුන් ආකාරයත්, ඒවායින් මිදී ඉදිරියට ගමන් කරන ආකාරයත් ගවේෂණය කිරීමට අපි ඔබව දිරිමත් කරමු. ශ්‍රී ලංකාව නව අදහස් සහ දැඩි අධිෂ්ඨානයකින් යුතුව නැවුම් ආරම්භයක් අත්විඳින ස්ථානයක සිටීයැයි සිතන්න. උගත් පාඩම්, ලැබූ ජයග්‍රහණ සහ අනාගතය සඳහා එය දකින සිහින වැනි මෙම විශිෂ්ට ගමනේ සිත් ඇදගන්නාසුළු කාරණා පිළිබඳ ඔබගේ රචනය මගින් විශ්ලේෂණය කරන්න. මෙම සුන්දර දූපතේ ඇදහිය නොහැකි කතාව ඔබ නිර්මාණශීලීව ප්‍රකාශ කරන්න.

**නිර්ණායක**

1. රචනා තරගයේ තේමාව වන්නේ: "පුනරුදය කරා: ශ්‍රී ලංකාවේ අතිදුෂ්කර චාරිකාව" යන්නයි.

2. ශාස්ත්‍රවේදී ආර්ථික විද්‍යාව (ගෞරව) උපාධි පාඨමාලාව, ශාස්ත්‍රවේදී මූල්‍ය ආර්ථික විද්‍යාව (ගෞරව) උපාධි පාඨමාලාව හා ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පාඨමාලාව සඳහා ආර්ථික විද්‍යාව හදාරණු ලබන සියලුම උපාධි අපේක්ෂකයින් සඳහා තරගය විවෘත වේ.

3. හොඳම රචනා ආර්ථික විද්‍යා අධ්‍යනාංශයේ විනිශ්චය මණ්ඩලයක් විසින් තෝරා ගනු ලැබේ. විනිශ්චය මණ්ඩලය විසින් ගනු ලබන හොඳම රචනා පිළිබඳ තීරණය අවසාන තීරණය වේ.

4. රචනා පහත සඳහන් නිර්ණායක අනුව විනිශ්චය කරනු ලැබේ:
   i. අදහස්වල නව්‍යත්වය
   ii. නිර්මාණශීලීත්වය
   iii. රචනයේ ව්‍යුහය සහ ඉදිරිපත් කිරීම
   iv. විශ්ලේෂණය සහ තර්කවල ගැඹුර

5. එක් ශිෂ්‍යයෙකුට එක් රචනාවක් පමණක් ඉදිරිපත් කිරීමට අවසර ලැබේ.

6. රචනා අනන්‍ය (එනම්, වෙනත් තැනක ප්‍රකාශයට පත් නොකළ හෝ වෙනත් රචනා තරගයකට ඉදිරිපත් නොකළ) සහ නව්‍ය විය යුතුය. රචනා චෞර්යයක් (plagiarism) සිදු කර ඇති බවට සොයා ගන්නා ඇතුළත් කිරීම් ප්‍රතික්ෂේප කරනු ඇත.

7. රචනා පුළුල් පාඨක පිරිසකට අවබෝධ කරගත හැකි විය යුතුය. ඒවා ශාස්ත්‍රීය සඟරා මාදිලියේ පත්‍රිකා වීමට අවශ්‍ය නොවේ.

**මාර්ගෝපදේශ**

1. උපරිම වචන සීමාව: වචන 500 යි
2. මාධ්‍ය: ඉංග්‍රීසි/සිංහල
3. අකුරු රටාව: Times New Roman/FM Abhaya
4. අකුරු ප්‍රමාණය: 12
5. පේළි පරතරය: 1.5
6. ඉදිරිපත් කිරීම් භාර ගන්නා අවසන් දිනය: **2023 ඔක්තෝබර් 06 වැනි දින ප.ව. 06:00**
7. ඔබගේ රචනාව https://forms.gle/DkJ75t3dLwQgnxDcA
   යන විද්‍යුත් සබැඳිය වෙත උඩුගත (upload) කරන්න MS-Word ආකෘති පමණක් වලංගු වේ).